# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023

2026 ජුනි

මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ දර්ශනය

**මහායාන දර්ශනය, තර්ක ශාස්ත්‍රය හා බෞද්ධ ඥාන මීමංසාව BUPH – E 3015**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. මහායාන බුදුසමයේ ප්‍රභවය සඳහා හේතු වූ දාර්ශනික පදනම පිළිබඳ සමාලෝචනයක් කරන්න.

02. බෝධිසත්ත්ව පරමාදර්ශය මහායාන බුදුසමයෙහි ප්‍රබෝධය උදෙසා ඉවහල් වූ ආකාරය පරීක්ෂා කරන්න.

03. බෝධිසත්ත්වවරයෙකු විසින් වර්ධනය කළ යුතු ගුණධර්ම පිළිබඳ පාරමිතා ධර්ම ඇසුරින් පෙන්වා දෙන්න.

04. මාධ්‍යමික දර්ශනයේ මූලික සිද්ධාන්ත ප්‍රතීත්‍යසමුත්පාදය මත පදනම් වී ඇති ආකාරය අධ්‍යයනය කරන්න.

05. යෝගාචර විඥ්ඥානවාදී ඉගැන්වීම් තුළ සම්මත ලෝකයෙහි පැවැත්ම මෙන්ම යථාර්ථය ද ප්‍රකට කර ඇති අයුරු 'ත්‍රිස්වභාව' ඇසුරින් පහදන්න.

06. තාන්ත්‍රික බුදුසමයෙහි ප්‍රභවය හා විකාසය සම්බන්ධ විද්වත් මතවාද ගෙනහැර දක්වන්න.

07. 'අනුමාන' යන්න බෞද්ධ තර්ක ශාස්ත්‍රයෙහි දී විවරණය වී ඇති ආකාරය සැකෙවින් දක්වන්න.

08. තර්කය පිළිබඳ බෞද්ධ ආකල්පය ගෙනහැර දක්වන්න.

09. බුද්ධකාලීන ඥාන මාර්ග පිළිබඳ විවරණයක් ඉදිරිපත් කරන්න.

10. පහත දැක්වෙන මාතෘකා අතුරින් දෙකකට (02) පමණක් ප්‍රමාණවත් විස්තර සපයන්න.

    1. ස්වාර්ථානුමානය
    2. පරාර්ථානුමානය
    3. හේත්වාභාස
    4. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය

*****************************